**ජල ආංශික සංවර්ධනය II ව්‍යාපෘතිය - 2015**

---

ජල ආංශික සංවර්ධනය II ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2008 ජූලි 29 දින එළඹි අංක එස්එල්-පී 93 දරන ණය ගිවිසුම සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2010 දෙසැම්බර් 16 දින එළඹි අංක එස්එල්-පී 93 දරන අතිරේක ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ජල ආංශික සංවර්ධනය II ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ මහ කොළඹ ප්‍රදේශයේ ජල සැපයුම් පහසුකම් ව්‍යාප්ත කිරීම මගින් ආරක්ෂිත පානීය ජලය සැපයීම, කොළඹ නගරයේ අඩු ආදායම් ජනතාව ඇතුලත් ආදායම් නොලබන ජලය අඩු කිරීම හා එමගින් එම ප්‍රදේශවල ජීවන පරිසරය වැඩිදියුණු කිරීම සඳහා දායකවීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 10,846 කට සමාන රු.මිලියන 10,330 ක් වන අතර, ඉන් ජපන් යෙන් මිලියන 8,388 කට සමාන රු.මිලියන 7,989 ක් හෙවත් සියයට 77.30 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟවී තිබුණි. ඉතිරි මුදල් ප්‍රමාණය වන ජපන් යෙන් මිලියන 2,458 කට සමාන රු.මිලියන 2,341 ක් හෙවත් සියයට 22.70 කට ශ්‍රී ලංකා රජය දායක වීමට බලාපොරොත්තුවේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 ජූලි මාසයේදී ආරම්භ කරන ලද අතර 2012 දෙසැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2017 මැයි 31 දක්වා දීර්ඝ කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය මුදල් වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන
---------------

### 2.1 මතය
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
---------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.මිලියන 741.49 ක් වූ කොන්ත්‍රාත්කරුට ගෙවන ලද එකතු කළ අගය මත බදු කෙරීගෙන යන වැඩ වටිනාකම යටතේ දැක්වීම වෙනුවට ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයට එරෙහිව හිලව් කර තිබුණි. ඒ හේතුවෙන් කෙරීගෙන යන වැඩ සහ ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකය එකම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, 2015 දෙසැම්බර් 31 දිනට ආධාර දෙන ආයතනය විසින් එකතු වටිනාකම රු. මිලියන 295.59 ක් වූ පොලී සහ කැපකිරීමේ ගාස්තු (Commitment Charges) අයකර තිබුණි. කෙසේ වුවත්, මෙම අගය ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

#### 2.2.2 නොසැසඳු ශේෂයන්
---------------------

2015 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. මිලියන 10,577.40 ක් වූ කෙරීගෙන යන වැඩ වටිනාකම ඊට අනුරූපී ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල

දැක්වෙන කෙරීගෙනයන වැඩ වටිනාකම වූ රු. මිලියන 9,560.40 සමඟ එකඟවී නොතිබුණි. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. මිලියන 7,622.55 ක් වූ විදේශ ණය ශේෂය රු. මිලියන 7,513.09 ක් වූ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන විදේශ ණය ශේෂය සමඟ එකඟවී නොතිබුණි.

### 2.2.3 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘතිය විසින් මිලදීගෙන තිබුණු ස්ථාවර වත්කම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත භාරදීමට හැකිවන පරිදි ව්‍යාපෘති ස්ථාවර වත්කම් ලේඛණය විධිමත් පරිදි පවත්වා නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ වසර 05 ක සේවා කාලය ඉක්මවූ කාර්යය මණ්ඩලය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන සැලසීමට 1983 අංක 12 දරන පාරිතෝෂික පනත ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් පියවර ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 8,388 | 7,989 | - | 2,344 | 2,661 | 8,268 | 10,737 |
| ශ්‍රීලංර | 2,458 | 2,341 | 472 | 209 | 236 | 1,465 | 1,849 |
| එකතුව | 10,846 | 10,330 | 472 | 2,553 | 2,897 | 9,733 | 12,586 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 නොවැම්බර් 12 දිනෙන් ණය කාලසීමාව අවසන් වුවද, ව්‍යාපෘතිය යටතේ ඇති වැඩ අවසන් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති කාලය 2017 මැයි 12 දින දක්වා දීර්ඝ කර තිබුණි. එමනිසා, ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා බැංකු ඇපකරයක් සහිත විශේෂ අත්තිකාරම් මුදලක් ලෙස කොන්ත්‍රාත්කරුගේ ඒ වෙනුවෙන් වූ බැංකු ගිණුමකට (Dedicated Bank Account) රු. මිලියන 1,128.33 ක් මාරුකිරීමට

ව්‍යාපෘතිය විසින් පියවර ගෙන තිබුණි. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනට ඒ වෙනුවෙන් වූ බැංකු ගිණුමේ රු. මිලියන 1,096.93 ක ප්‍රයෝජනයට නොගත් අත්තිකාරම් මුදලක් පැවතුණි.

(ආ) ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් නිසා 2015 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 57.49 ක පොලී සහ කැපකිරීමේ ගාස්තු (Commitment Charges) ව්‍යාපෘතිය විසින් දරා තිබූ බව නිරීක්ෂණය විය.

**3.2 භෞතික කාර්යසාධනය**

--------------------------

ව්‍යාපෘති ප්‍රගති වාර්තා ප්‍රකාරව, 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාර්යයන්හි සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 98.50 ලෙස වාර්තා කර තිබුණි. තවද, ව්‍යාපෘතිය විසින් අවසන් කිරීමට සැලසුම් කර තිබූ කොන්ත්‍රාත් 21 ක වැඩ අතරින් කොන්ත්‍රාත් 15 ක වැඩකටයුතු පමණක් 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි.

**3.3 මතභේදාත්මක ස්වරූපයේ කරුණු**

------------------------------------

වාර්තාවේ ඡේද අංක 3.1(අ) හි දක්වා ඇති පරිදි, ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිමකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකුගේ වෙන්කළ බැංකු ඉතිරිකිරීමේ ගිණුමකට රු. මිලියන 1,128.33 ක් මාරු කිරීමට ව්‍යාපෘතිය විසින් පියවර ගෙන තිබුණි. කෙසේ වුවත් ඉහත සඳහන් කටයුත්ත සඳහා මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. ඊට අමතරව, සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරු විසින් උපයන ලද රු. මිලියන 6.64 ක පොළිය 2015 දෙසැම්බර් 31 දින වනවිටත් ව්‍යාපෘතියට මාරුකර නොතිබුණි.

**3.4 මූල්‍ය පාලන ගැටළු**

--------------------

මුදල් රෙගුලාසි 133 හා 2010 ජූලි 26 දිනැති අංක 05 දරන මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය සිදුකර නොතිබුණි.

**3.5 පරිබාහිර ගනුදෙනු**

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් වැයකළ රු. මිලියන 24.06 ක් වූ ජල සම්ප්‍රේෂණ පිරිවැය, ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාල නොවන බව නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘතිය විසින් සිවිල් ඉදිකිරීම් වැඩවල නිරතව සිටි කොන්ත්‍රාත්කරුවන් මගින් මිලදීගත් පිරිවැය රු. මිලියන 84.71 ක් වූ ද්‍රව්‍ය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවලට මාරුකර තිබුණි. මේ අනුව ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කර තිබුණු ද්‍රව්‍ය, තථ්‍ය අවශ්‍යතාවය ඇගයීමකින් තොරව ප්‍රසම්පාදනය කර තිබුණු බව දැක්වුණි.